**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-----------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශේෂ පිරික්සුම අනුව 2019 වර්ෂයේ වෙනත් ලැබීම් වටිනාකම හා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව එම වටිනාකම අතර රු. 281,873,012ක නොසැසඳුණු වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් සසඳා නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. | මෙම වරද ලබන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කරන බව. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් ප්‍රකාශයේ ශේෂ සමඟ එකඟ විය යුතු වුවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව තැන්පතු ගිණුම් ශේෂය හා භාණ්ඩාගාර මුද්‍රිත අනුව එදිනට එම ශේෂය අතර, රු.25,919,464 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතු අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ තැන්පතු ගිණුම් ශේෂය වශයෙන් රු.442,433,369 ක් දැක්විය යුතුය. | පොදු තැන්පත් ගිණුම හා භාණ්ඩාගාර මුද්‍රිතය අනුව ශේෂයන් වෙනස් නොමැති බව. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දී ඇති අයිතමයන් 06 ක කේවල තොරතුරුවල සාරාංශය හා මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ - 6 ආකෘතිය අනුව එම අයිතමයන් අතර රු.500,414,005ක නොසැසඳුණු වෙනසක් නිරීක්ෂණය විය. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි නිසි ලෙස පොත් පත් සහ වාර්තා පවත්වා ගැනීමත්, සන්සන්දනයන් සිදු කිරීම මඟින් නිවැරදිතාවය තහවුරු කර ගැනීමත් කළ යුතුය. | සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ආරම්භ ශේෂවල දෝෂ පැවතීමත්, අදාළ තීරුවලට වාර්තා කිරීමේ දෝෂ පැවතීමත්ය. |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ තැන්පතු ලැබීම් වටිනාකම වූ රු.468,352,833ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දැක්විය යුතු වුවද, එම වටිනාකම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි. | තැන්පතු ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් දැක්විය යුතු ය. | විග්‍රහ කර ගැනීමේ දුර්වලතාවයක් නිසා වූ කරුණක් බැවින් ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| (ආ) ඒසීඒ-6 ආකෘතියේ සඳහන් මූල්‍ය නොවන වත්කම් විකිණීම් රු.1,325,437ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා නොතිබුණි. | වත්කම් විකිණීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වශයෙන් දැක්විය යුතු ය. | විග්‍රහ කර ගැනීමේ දුර්වලතාවයක් නිසා වූ කරුණක් බැවින් ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| (ඇ) 2019 වර්ෂයේ අත්තිකාරම් අයකර ගැනීම් රු.85,385,621ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා නොතිබුණි. | අත්තිකාරම් අයකර ගැනීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වශයෙන් දැක්විය යුතු ය. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. |

## 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම

--------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල දී පවතින තත්ත්වය සමාලෝචනය කරන බව. |

## 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මුදල් රෙගුලාසි 396 (ඈ) | 566,990 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02කට අදාළව 2019 දෙසැම්බර් 31 දින වන විට මාස 06 ඉක්ම වී මාස 02 හා මාස 24ක අතර කාලයක් ගත වී ගොස් තිබුණු චෙක්පත් 07ක් සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කටයුතු කර එකී ආදායමට ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිවැරදි කිරීම් ඉදිරියේ දී සිදු කරන බව |
| (ii) මුදල් රෙගුලාසි 571 | 37,486,938 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10කට අදාළව වර්ෂ 02ක් ඉක්ම වූ තැන්පතු 176ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතුකල යුතුය. | තැන්පත් ගෙවීම් කිරීම සඳහා භාණ්ඩාගාරය මගින් ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදුවන බව. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | | |
| (i) 1.2.1 (ඇ) වගන්තිය | 527,545 | ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 දෙසැම්බර් 14 දින මාදොල වසම - නිල සෙවන කාර්යාලයේ දෙවන අදියර ඉදිකිරීම ඇස්තමේන්තු රේටයන් පදනම් කරගෙන සෘජුවම මුල් කොන්ත්‍රාත්කරුට පිරිනමා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) වගන්තිය අනුව කටයුතු කල යුතුය. | මුල් ප්‍රතිපාදනවලට ලංසු ඉදිරිපත් කල එකම කොන්ත්‍රාත්කරු ඇය වීම බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) 4.2.1 (අ), (ආ) සහ (ඇ) වගන්තිය | - | අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු නමුත් එකී විධිවිධාන ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05කට අදාළව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක සමාලෝචිත වර්ෂයට අදාල විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම ද පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ) සහ (ඇ) වගන්තිය අනුව කටයුතු කල යුතුය. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව. |
| | (iii) 5.4.8 (අ) වගන්තිය | 98,542 | කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා රු.1,970,841ක කොන්ත්‍රාත් මුදලින් සියයට 5කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු නමුත් පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) වගන්තිය අනුව කටයුතු කල යුතුය. | ඉදිරියේ දී අදාල කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කරන බව. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරනරාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>-------------------------- | | | | |
| | (i) 3.1 වගන්තිය | 1,428,596 | දේශීය/පළාත්බද ප්‍රජාපාදක සංවිධානයක් ලෙස සැළකිය නොහැකි රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාල සුභසාධක සංගමය සමග 2019 වර්ෂය තුළ කොන්ත්‍රාත්තු 08ක් ඉටු කරවා ගැනීම සඳහා ගිවිසුම්ගතව තිබුණි. | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. | ලාභ නොලබන සංගමයක් බැවින් අදාළ සුභසාධන සංගමය මගින් එකී කර්මාන්ත ඉටු කරවා ගත් බව. |
| | (ii) 3.2 වගන්තිය | 340,359,133 | සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම්, වැඩ, කොන්ත්‍රාත් පැවරිය හැකි වුවද පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකී විධිවිධානවලට පටහැනිව සංවර්ධන වැඩසටහන් 13ක් යටතේ ව්‍යාපෘති 938ක් ඉටු කිරීම සඳහා නිර්දේශ කර ගෙවීම් සිදු කර තිබුණි. | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. | චක්‍රලේඛය ප්‍රකාරව සුදුසුකම් පරීක්ෂා කිරීම නොකල බවත් ඉදිරියේ දී එවැනි අඩුපාඩු නොවන ලෙසට නිලධාරීන්ට උපදෙස් දුන් බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2011 පෙබරවාරි 10 දිනැති අංක ජා.ගො.ප.ස 2011/01 දරන අපදා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 ඡේදය | 2,000,000 | නාය යෑම් අවධානම් දිස්ත්‍රික්කවල ව්‍යාපෘති අනුමත කරන ආයතන විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් අදාළ යෝග්‍යතා සහතිකය/ නිර්දේශය ලබා ගැනීම අනිවාර්යෙන්ම සිදුකළ යුතු නමුත් ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව කොටාමුල්ල වසමට අයත් නිලසෙවන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2011 පෙබරවාරි 10 දිනැති අංක ජා.ගො.ප.ස 2011/01 දරන අපදා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. | ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් නිර්දේශ ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු බව. |
| (ඉ) | 2019 ජනවාරි 10 දිනැති අංක MNPEA 01/2019 දරන විමධ්‍යගත අයවැය වැඩසටහන චක්‍රලේඛයේ 2.8 ඡේදය | 416,487 | රජයේ ව්‍යාපෘති පොදු කාර්යයන් සඳහා ක්‍රියාත්මක කළ යුතු අතර එක් එක් පුද්ගලයන්ට හෝ පුද්ගලික කටයුතු සඳහා ඍජු ප්‍රදාන ලබා නොදිය යුතු බව දක්වා තිබුණ ද, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පුද්ගලික හිස් ඉඩම් දෙකකට අදාල ප්‍රවේශ මාර්ග කොටසක් හා පැති බැම්මේ කොටසක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. | 2019 ජනවාරි 10 දිනැති අංක MNPEA01/2019 දරන විමධ්‍යගත අයවැය වැඩසටහන 2019 චක්‍රලේඛයේ 2.8 ඡේදය ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉඩම් සඳහා ක්‍රමවත් ප්‍රවේශ මාර්ගයක් නොමැති බැවින් එම ඉඩම්වල සංවර්ධන කටයුතු කිරීමට නොහැකි වී තිබුණු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ශීර්ෂ 278 සඳහා සැලසුම අනුව ඉල්ලුම් කළ යුතු අග්‍රිමය රු.1,096,996,000 ක් වුවද, ඉල්ලුම් කළ අග්‍රිමය රු. 2,273,485,000 ක් වූයෙන් රු.1,176,489,000 ක වෙනසක් ද, ලද අග්‍රිමය රු.1,136,110,000 ක් වූයෙන් ඉල්ලූ අග්‍රිමය හා ලද අග්‍රිමය අතර රු.1,137,375,000 ක වෙනසක් ද, ඒ අනුව සැලසුම් කළ හා ලද අග්‍රිමය අතර රු.39,114,000 ක වෙනසක් ද නිරීක්ෂණය විය. මේ අනුව අග්‍රිම අවශ්‍යතා සැලසුම් කිරීම හා අග්‍රිම පාලනය නිසි අයුරින් සිදු වී නොමැති බව විගණනයේ දී නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අග්‍රිම කළමනාකරණය මනා ලෙස සිදුකර ගැනීමට කටයුතු කල යුතුය. | නිරීක්ෂණය හා එකඟ වන බවත්, වාර්ෂික අග්‍රිම අවශ්‍යතාවය සකස් කරන්නේ වාර්ෂික විසර්ජන පනත මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන පදනම් කරගෙන බවත්. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිසි පරිදි ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා වැය විෂයයන් 19ක අවුරා තැබීම් සියයට 25ට අමතරව තවදුරටත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 සිට සියයට 62 දක්වා වූ පරාසයක ඉතිරිවීම් පැවතුණි. මෙලෙස ඉතිරි ප්‍රතිපාදනවල එකතුව රු.39,035,238ක් විය. 278-1-1-0-2509 වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් ඉඹුල්පෙ සහ අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ප්‍රජා පාදක හරිත සමාජ (Community based Green clubs) ස්ථාපිත කිරීම සඳහා රු. 2,700,000ක් වෙන්කර තිබුණ ද, ඉන් වියදම් කර තිබුණේ රු. 344,000 ක් පමණි. | මුදල් රෙගුලාසි 50 අනුව නිසි පරිදි ඇස්තමේන්තු සකස් කිරීම සිදු කළ යුතු ය. | අක් මුදල් නොමැති වීම, වියදම් මනා ලෙස කළමනාකරණය කිරීම, බිල්පත් ඉදිරිපත් නොකිරීම, සියයට 25 අනිවාර්යය ඉතිරි කිරීම් සිදුකිරීම යනාදී වශයෙන් එකී ඉතිරි කිරීම්වලට හේතු වූ බව. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 255/2017 හා 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(අ) ඡේදය අනුව පුද්ගල පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුල බැඳීම් හඳුනාගත යුතු වුවත්, ඊට පටහැනිව එකතුව රු.943,209ක් වූ බැඳීම් සඳහා එළඹ තිබුණි. | අංක 255/2017 හා 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(අ) ඡේදය අනුව කටයුතු කල යුතුය. | අදාළ බිල්පත් එම වර්ෂයේදීම ඉදිරිපත් නොවීම බව. |

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17කට වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 28කින් අවශ්‍යතා 73ක් සඳහා ලබාදුන් රු.මිලියන 3,354ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයේ රු.මිලියන 959.9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ඉතිරිවීම් එක් එක් අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදනවලින් අවුරා තැබීම් සියයට 25ට අමතරව, සියයට 5 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | අදාල රේඛිය අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා මහා භාණ්ඩාගාරය සමඟ වර්ෂයේ මුල් භාගයේ සිටම නිරන්තර සම්බන්ධයකින් යුක්තව කටයුතු කර ව්‍යාපෘති සඳහා වෙන්කල ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. | ප්‍රතිපාදන ඉතිරිවීම්වලට ප්‍රධාන හේතුව වන්නේ ප්‍රමාණවත් අක් මුදල් නොමැති වීම බව. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක 05/2019 හා 2019 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ස්ථාන මාරු වීම් යන/එන නිලධාරීන්ට, ණය මුදල් ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින හා අවසාන වාරික අයකර අවුරුද්දකට වඩා කල් ගත වී තිබුණු වැඩ තහනම් කළ නිලධාරීන්ට අදාලව රු. 1,548,793ක ණය ශේෂ 09ක් අයකර ගැනීමට හා නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අංක 05/2019 හා 2019 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ණය ශේෂ අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. |

## 2.6 තැන්පතු ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08කට අදාළව කර්මාන්ත 179කින් ලබාගත් රැඳවුම් මුදල් රු.12,670,727ක් සඳහා අදාල දෝෂ වගකීම් කාල සීමාව ඉකුත්ව ගොස් විගණිත දිනය වූ 2020 ජනවාරි 23 දින වන විට මාස 02 සිට මාස 34ක් ගත වී තිබුණ ද, ඒවා නිදහස් නොකර තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවාගෙන තිබුණි. | දෝෂ වගකීම් කාල සීමාව ඉකුත්ව ගොස් ඇති රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කල යුතුය. | තැන්පතු නිදහස් කිරීම සඳහා ප්‍රමාණවත් අක් මුදල් නොමැති බවත්, කාර්මික නිලධාරී විසින් වැඩ පරීක්ෂා කිරීමෙන් පසු රැඳවුම් මුදල් නිදහස් කරන බවත් ආදී හේතූන් මීට අදාළ බවත්. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------- | -------------------------- |
| ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ව්‍යාපෘති 04ක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට රු.6,906,562 ක ප්‍රතිපාදන ලබා දුන්නද එකී ව්‍යාපෘති ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එකී ආයතනය වෙතම ආපසු පවරා දී තිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන අදාල අරමුණ සඳහා නිසි අයුරින් යෙදවීමට වග බලා ගත යුතු වීම. | අයහපත් කාලගුණික තත්ත්වයන්, ප්‍රතිපාදන ප්‍රමාදවීම්, තාක්ෂණික හේතුන්, ඇස්තමේන්තු නියමිත දිනට නොලැබීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව මතභේද පැවතීම ආදී හේතුන් මීට අදාළ බව |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------- | --------------------------- |
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට අදාලව 2018 සහ 2019 වර්ෂයන්හි ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය පරීක්ෂාවේ දී අංශ 15ක ක්‍රියාකාරකම් 52ක් එහි අපේක්ෂිත ඉලක්ක වෙත ලඟා නොවීමේ ප්‍රතිශතය සියයට 25 සිට සියයට 100 අතර පැවතුණි. | ඉලක්කයන් ලඟා කර ගත හැකි පරිදි සැලසුම් සකස් කළ යුතු අතර එකී ඉලක්කයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. | නිලධාරීන් හට පාලනය කළ නොහැකි කරුණු නිසා ඇතැම් ඉලක්කවලට ලඟා වීමට නොහැකි වූ බව. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට රජයේ ඉඩම් සඳහා බලපත්‍ර / දීමනාපත්‍ර නිකුත් කිරීමේ දී, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08ක පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන 01 සිට 09ක් තරම් අඩු පරාසයක් ගෙන තිබීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08කට අදාළව අනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් නියමානුකූල කිරීම සඳහා හඳුනාගත් ප්‍රමාණය සියයට 6 සිට සියයට 48ක් තරම් අඩු මට්ටමක පැවතීමත්, එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් නියමානුකූල කිරීමට තිබූ ඉඩම් ප්‍රමාණය හඳුනා නොගැනීමත්, තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින් කොට්ඨාශයට අදාළ රජයේ ඉඩම් කැබලි සංඛ්‍යාව හා අනවසර ඉඩම් නියමානුකූල කිරීමට ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව පිළිබඳව තොරතුරු නිශ්චිතව හඳුනාගෙන නොතිබීමත් හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි. තවද මේ | අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතු ය. | රජයේ ඉඩම් සඳහා බලපත්‍ර/දීමනාපත්‍ර ලබා දීම, ප්‍රාදේශීය ලේකම් තනිව සිදු කරනු ලබන කාර්යයක් නොවන බවත් ඒ සඳහා සම්බන්ධ වන අනෙකුත් ආයතනවලින් ලැබෙන ප්‍රතිචාර/සහයෝගය මත ප්‍රමාදයන් ඇති වන බව. |

සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20දිනැති චක්‍රලේඛ අංක 2008/04 හි සඳහන් විධිවිධාන අනුගමනය කර නොතිබුණ බවද නිරීක්ෂණය විය.

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂා කළ ඇස්තමේන්තුගත පිරිවැයරු. මිලියන 39.8ක් වූ ව්‍යාපෘති 127ක් නිම නොකර අත්හැර දමා තිබුණි. | නියමිත කාල වකවානුව තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු ය. | නිරීක්ෂණය හා එකඟ වන බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පාලනයෙන් බැහැර කාරණා බවත් ය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක සමාලෝචිත වර්ෂයේ දී නිම කිරීමට සැලසුම් කළ ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 48.4ක් වූ ව්‍යාපෘති 122ක් ඉදිකිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඊට අදාළව වෙන් කළ ප්‍රතිපාදනයෙන් ඉතිරිය රු.මිලියන 21.2ක් හෙවත් සියයට 44ක් විය. | නියමිත කාල වකවානුව තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකි වන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටුකිරීමට කටයුතු කළ යුතු ය. | ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම, අක්මුදල් ලැබීම ප්‍රමාද වීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කළ කාල සීමාවේ දී අධික වර්ෂාව හා අයහපත් කාලගුණික තත්ත්වයන් පැවතීමත් ය. |
| (ආ) 2016, 2017, 2018 හා 2019 වර්ෂයන්ට අදාළව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16කට අදාළව දිස්ත්‍රික්කයේ විකල්ප ඉඩම් ලබා දීමට හඳුනා ගත් පවුල් සංඛ්‍යාව 2456ක් වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන් යෝග්‍ය ඉඩම් ලබාදුන් පවුල් සංඛ්‍යාව 1027ක් පමණක් විය. | දැනට අත්පත් කරගෙන ඇති ඉඩම්වල මිනින්දෝරු වාර්තා කඩිනමින් ලබාගෙන ඉතිරි පවුල් සැලකිය යුතු සංඛ්‍යාවක් සඳහා හෝ ඉඩම් ලබාදීමට පියවර ගත යුතුය. | ඉඩම් අත්පත් කර ගැනීමට දිගු කාලයක් ගත වීම, අත්පත් කරගත් ඉඩම්වල පදිංචියට යාමට ප්‍රතිලාභීන්ගේ ඇති අකමැත්ත සහ යෝග්‍ය ඉඩම් නොමැති වීම බවත් ය. |

| | | |
|---|---|---|
| (ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ 2016, 2017, 2018 හා 2019 වර්ෂයන්හි ගංවතුරින් හා නායයාම්වලින් හානියට පත් මුළු නිවාස ගණන 15082ක් වූ අතර ලබාදිය යුතුව තිබූ මුළු වන්දි මුදලරු. 943,862,379ක් වුවද, 2019 දෙසැම්බර් 31 වන විට තවදුරටත් ලබාදිය යුතු මුදල ලෙස රු. 363,874,761ක් පැවතුණි. | භාණ්ඩාගාරය හා අදාළ රේඛීය අමාත්‍යාංශය සමඟ සමීප සම්බන්ධතාවයකින් යුතුව අදාළ වන්දි මුදල් කඩිනමින් ගෙවීමට හැකිවන පරිදි කටයුතු සැලසුම් කළ යුතු ය. | ජාතික රක්ෂණභාර අරමුදල වෙත යොමු කර ඇති වන්දි මුදල් මෙතෙක් නොලැබීම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තක්සේරු කමිටු මගින් සිදු කරන ලද තක්සේරු වටිනාකම ජාතික රක්ෂණභාර අරමුදල මගින් සංශෝධනය කිරීම හෝ තක්සේරු කර ඉල්ලා ඇති මුළු වන්දි මුදල් නොලැබීම මීට හේතු වූ බවත් ය. |

**3.5 ප්‍රසම්පාදනයන්**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04කට අදාළව ඉටුකරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත් නියැදි පරීක්ෂාවේ දී කර්මාන්ත 14ක වැඩ විෂයයන් 39 සඳහා රු.2,727,033ක් විශේෂ ගාස්තු උපලේඛන (SSR) යටතේ ගෙවා තිබූ නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයා හෝ ඉහළ තාක්ෂණ දැනුමක් ඇති නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරුවරයා හෝ ඉහළ තාක්ෂණ දැනුමක් ඇති නිලධාරියෙකු විසින් විශේෂ ගාස්තු උපලේඛන (SSR) අනුමත කිරීම කල යුතුය. | ඉදිරි ව්‍යාපෘති වලදී උපදෙස් පරිදි කටයුතු කරන බව |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09ක ව්‍යාපෘති 06කට අදාළව විධිමත් තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කර නියමිත සම්පිණ්ඩන ශක්තිය පවතී දැයි තහවුරු කර ගැනීමකින් තොරව කොන්ක්‍රීට් මිශ්‍රණ අතුරා ඉදිකරන ලද මාර්ග 73කට අදාළව කොන්ක්‍රීට් ඝන මීටර් ($m^3$) 1,774.45ක් සඳහා රු. 46,347,863ක් ගෙවීම් නිර්දේශ කර තිබුණි. | මාර්ග ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී නියමිත සම්පිණ්ඩන ශක්තිය පවතීදැයි යන්න තහවුරු කරගත යුතුය. | මාර්ගය අඩුපාඩු නිවැරදි කරමින් පවතින බව, එවැනි පරීක්ෂාවක් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතු බවට උපදෙස් ලැබී නොමැති බවත්,ඒ සඳහා අවශ්‍ය පහසුකම් ආයතනය සතුව නොමැති බවත් අවශ්‍ය පහසුකම් ලැබෙන්නේ නම් එකී පරීක්ෂණ සිදු කර අවශ්‍ය නිර්දේශ ලබාගන්නා බවත්,එවැනි පරීක්ෂාවක් සිදු කිරීමට විශේෂ අවස්ථාවක් හෝ ගැටළුවක් ඇති නොවූ බවත්,සම්පිණ්ඩන ශක්තිය පරීක්ෂා කරන ලද අතර අඩු ස්ථාන නැවත ප්‍රතිසංස්කරණය කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දුන් බවත් ආදී වශයෙන් පිළිතුරු ඉදිරිපත් කර තිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05කට අදාළව අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 04ක් යටතේ රු.9,842,506කට ගිවිසුම්ගත කර්මාන්ත 15ක් සම්බන්ධයෙන් 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (iv)හා අත්සන් කරන ලද ගිවිසුමේ 15 වගන්තියට පටහැනිව ගොවි සංවිධානයට සියයට 5ක මුදලක් ලබා ගැනීමේ පදනම මත උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි. | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (iv) හා අත්සන් කරන ලද ගිවිසුමේ 15 වගන්තියට අනුව කටයුතු කල යුතුය. | එලෙස උප කොන්ත්‍රාත් ලබා දී ඇති බවට තහවුරු වී නොමැති බවත්, කොන්ත්‍රාත් සමිතිය විසින් උප කොන්ත්‍රාත් නොදෙන බවට ලිපියක් ලබා ගෙන ගොනුගත කර ඇති බවත්ය. |
| (ඈ) පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව රු.4,000,000කට ගිවිසුම්ගත කර්මාන්ත 02ක් සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i) වගන්තිය ප්‍රකාරව පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත, කොන්ත්‍රාත් මුදලින් සියයට 20ක උපරිමයක් අත්තිකාරම් ලෙස ගෙවිය හැකිව තිබුණි. නමුත් එකී විධිවිධානවලට පටහැනිව රු.800,000ක අත්තිකාරම් මුදල ගෙවා තිබුණ අතර ප්‍රජා දායකත්වය හා කොන්ත්‍රාත්කරු විසින් ඉටු කළ යුතු වැඩ කොටස් වෙන් වෙන් වශයෙන් දැක්වෙන විස්තරාත්මක එකඟ වූ ප්‍රමාණ පත්‍රයක් පිළියෙල කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (i) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිරීක්ෂණය හා එකඟ වන බවත්, ඉදිරියේ දී සියයට 20ක අත්තිකාරම් ගෙවීමේ දී මාර්ගෝපදේශයේ උපදෙස් පරිදි කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දුන් බවත් ය. |
| (ඉ) පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව රු.5,804,767කට වැඩ අවසන් කළ කර්මාන්ත 02ක අවසාන බිල්පත හා ඒකාබද්ධ මිනුම් සහිත ප්‍රමාණපත්‍ර පිළියෙල කිරීමේදී ප්‍රජා දායකත්වයෙන් ඉටු කරන ලද රු.1,822,454 ක් වූ වැඩ කොන්ත්‍රාත්කරු විසින් ඉටු කරන ලද වැඩ කොටස් සේ සළකා එම බිල්පත් නිර්දේශ කර, සහතික කර අනුමත කර ගෙවා තිබුණි. | බිල්පත් නිර්දේශ කිරීම, සහතිකකිරීම හා අනුමතකිරීම නිවැරදිව කල යුතුය. | නිරීක්ෂණය හා එකඟ වන බවත්, මේ සම්බන්ධව පරීක්ෂණයකට යොමු කර ඇති බවත් ය. |
| (ඊ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට අදාළව අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 03ක් යටතේ රු.7,554,668කට ගිවිසුම්ගත කර්මාන්ත 09ක් ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී හැමර් පරීක්ෂාව මගින් සම්පිණ්ඩන ශක්තිය පරීක්ෂා කරන ලද අතර එම මාර්ගයන්හි සම්පිණ්ඩන ශක්කිය සාමාන්‍යයෙන් පැවතිය යුතු මට්ටමට වඩා $20N/mm^2$ ක අඩු අගයක් ගෙන තිබුණි. | මාර්ග ඉදිකිරීම් සඳහා ගෙවීම් කිරීමේදී නියමිත සම්පිණ්ඩන ශක්තිය පවතීදැයි යන්න තහවුරු කරගත යුතුය. | අදාළ ගෙවීම් කටයුතු සිදුකර නොමැති බැවින් ඉංජිනේරු උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවත්, ඉදිරියේ දී නිවැරදි කිරීම් සිදු කිරීමට නියමිත බවත් ය. |

| | | |
|---|---|---|
| (උ) මහා මාර්ග උපලේඛනගත අනුපාත (HSR)කේත අංක ST1-047 අනුව කොන්ක්‍රීට් මිශ්‍රණය කිරීමේ දී කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් භාවිතා කර මිශ්‍ර කර මාර්ගයට යෙදිය යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02කට අදාලව රු.2,030,486කට ගිවිසුම්ගත කර්මාන්ත 03ක් සම්බන්ධයෙන් කොන්ක්‍රීට් ප්‍රවාහනයට භාවිතා කරනු ලබන යන්ත්‍රය(Truck Mixer) භාවිතයෙන් කොන්ක්‍රීට් මිශ්‍ර කර තිබුණි. | කොන්ක්‍රීට් මිශ්‍රණය සිදු කිරීම නියමිත ප්‍රමිතියෙන් සිදු කල යුතුය. | මින් ඉදිරියට එවැනි අඩුපාඩු නොවන බවට වග බලා ගන්නා බව. |

**3.6 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 06ක ප්‍රාදේශිය ලේකම්වරයාට අයත් ග්‍රාම නිලධාරි වසම් 20ක පිහිටි භාවිතයට නොගන්නා රජයේ ගොඩනැගිලි 21ක් ඵලදායි කාර්යයකට යොදවා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර විගණිත දිනය වූ 2020 ජනවාරි 27 වන විටත් භූමිය අනවසර අල්ලා ගැනීම්වලට ලක්ව තිබීම, ගොඩනැගිලි අබලන්ව පැවතීම හා වසා දමා තිබීම ආදී කරුණු නිරීක්ෂණය විය. | අදාල දේපල විධිමත් ලෙස උපයෝජනය කරගැනීමට පියවර ගත යුතු අතර රජයේ දේපළවල ආරක්ෂාව සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු ය. | ඉදිරියේ දී පොදු කටයුතු සඳහා යොදා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වුවහොත් ඒ සඳහා යොදා ගන්නා බව |
| (ආ) ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ශ්‍රීලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීමේ අරමුණින් ආරම්භ කරන ලද ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා වැය ශීර්ෂ අංක 001-2-6-6-2509 යටතේ රු.3,178,000ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. එක් එක් වසම්වල පිහිටුවා ඇති ජනතා සමිති සඳහා වසම්වලජීවනෝපාය සංවර්ධනයට, ධාරිතාසංවර්ධනයට හා යටිතල පහසුකම්සංවර්ධනයට වශයෙන් එක් වසමකට රු.986,550 බැගින් රු.2,959,650ක මුදල් 2018 දෙසැම්බර් 29 දින ලබා දී තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විටත්තෝරාගත් වසම් 03හිම යටිතල පහසුකම්සංවර්ධනයට වැය කළ යුතු සියයට20ක ප්‍රමාණය පමණක් භාවිතයටගෙන තිබුණු අතර ඉතිරි මුදල් නිෂ්කාර්යව ගිණුම්වල රඳවාගෙන තිබුණි. | ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදිත මුදල් නිසි පරිදි උපයෝජනය කල යුතුය. | ලැබී ඇති උපදෙස් අනුව ක්‍රියා මාර්ග අනුගමනය කරමින් පවතින බව. |

## 3.7 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක ඇප තැබිය යුතු නිලධාරීන් 61 දෙනෙක් විසින් අදාළ ඇප මුදල් තැන්පත් කර නොමැති බවත්, මුදල් රෙගුලාසි 881 (ii) සඳහන් විධිවිධාන ප්‍රකාරව එලෙස ඇප තැබීමට අවශ්‍ය සිය යටත් නිලධාරීන් නියමිත කාල සීමාව ඇතුළත එසේ ක්‍රියා කරන බවට අදාළ ප්‍රධානීන් විසින් වග බලා ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 880 හා 881 (ii) ප්‍රකාරව ඇප තැබීමේ කටයුතු සිදු කළ යුතු ය. | ඇප තැන්පත් නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව |

## 3.8 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 අගෝස්තු 18 දිනැති අභ්‍යන්තර විගණන උපදෙස් අංක 22/2014 දරන දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියේ ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ වූ 04 වන උපදේශය ප්‍රකාරවනව ඉදිකිරීමක් වෙනුවට ප්‍රදේශයේ භාවිතා කළ හැකි රජයේ වෙනත් ගොඩනැගිලි තිබේ දැයි යන්න පරීක්ෂා කළ යුතුව තිබුණි.එසේ වුවද රත්නපුර බේරුකැටිය පාසල් භූමියේ ප්‍රයෝජනයට ගත හැකිව තිබූ වර්ග අඩි 1180ක වසා දමා තිබූ පාසල් ගොඩනැගිල්ලක් තිබියදීම, එම ගොඩනැගිල්ලට ඉදිරිපසින් ප්‍රජාදායකත්වයරු. 961,261ක් හා රජයේ දායකත්වයරු. 2,000,000ක් සහිතව වර්ග අඩි 729ක් වූ ගල්ලින්න නිල සෙවන කාර්යාලය ඉදිකර තිබුණි. මේ හේතුවෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ රජයේ ගොඩනැගිලි නොමැති ග්‍රාම නිලධාරී වසමක මෙම නිල සෙවන කාර්යාලය ඉදිකිරීමට තිබූ අවස්ථාව මගහැරී යාමෙන් රජයේ මුදල් ප්‍රමාණවත් සැළකිල්ලක් නොදක්වමින් වැය කර තිබූ බව දක්නට ලැබුණි. | 2014 අගෝස්තු 18 දිනැති අභ්‍යන්තර විගණන උපදෙස් අංක 22/2014 දරන දිස්ත්‍රික් ලේකම්ගේ ලිපියේ ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ වූ 04 වන උපදෙස අනුව ක්‍රියා කල යුතුය. | විමසුම සම්බන්ධයෙන් පරීක්ෂණයකට යොමු කර ඇති බව |

**3.9 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට අදාළව රු. 13,225,131ක් ගෙවා වැඩ අවසන් කරන ලද නඩත්තු කාලය අවසන් වූ මාර්ග 16ක් විධිමත්ව අදාළ ප්‍රාදේශීය සභාවන් වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.තවද ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කර්මාන්ත 13 තුළ ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු නොකරන වෙනත් ආයතනවලට අයත් පිරිවැය රු.4,522,000ක්වූ ඉදිකිරීම් 04ක් ද ඇතුළත්ව තිබුණි. | වැඩ අවසන් කරන ලද නඩත්තු කාලය අවසන් වූ මාර්ග විධිමත්ව අදාළ ප්‍රාදේශීය සභාවන් වෙත භාරදීමට කටයුතු කල යුතුය. | වැඩ අවසන් කරන ලද මාර්ග අදාළ ප්‍රාදේශීය සභාව වෙත භාරදීමට කටයුතු කල බවත්, වෙනත් ඉදිකිරීම් 04ක් ඇතුළත්ව තිබීම නිවැරදි කරන බවත් ය. |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට අදාළව විශ්‍රාමිකයින් 12 දෙනෙකුට රු.1,772,635ක් හා අයගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනත්දරු විශ්‍රාම වැටුප් හිමි පුද්ගලයෙකුට රු.136,998ක් වශයෙන් රු.1,909,633ක වැඩිපුර ගෙවීම් විගණිත දිනය වූ 2020 ජනවාරි 23 වන විටත් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | අයගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව විශ්‍රාම වැටුප් ගෙවීම 2020 ජනවාරි සිට නතර කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කර ඇති බව. |
| (ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට අදාළව කර්මාන්ත 04ක්සඳහා රු. 5,353,164ක් ගෙවා ගොඩනැගිලි වැඩ අවසන් කර 2017 දෙසැම්බර් මස මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ලබා දී තිබුණ ද, විගණිත දිනය වූ 2019 දෙසැම්බර් වන විටත් ගොඩනැගිල්ලට අවශ්‍ය ජල හා විදුලි පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විදුලිය සහ ජලය අත්‍යවශ්‍ය සාධකයක් වන බැවින් පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. | ඇස්තමේන්තු සහිතව ඉල්ලීම් කර යොමු කර ඇති නමුත් මෙතෙක් ප්‍රතිපාදන ලැබී නොමැති බවත්, අදාළ පරීක්ෂණයන්ට යොමු කර ඇති බවත් ආදී වශයෙන් හේතුන් දක්වා තිබීම. |

**3.10 නොවිසඳී ඇති විගණන ඡේද**

--------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | | | |
| 2013 | 1.7 (අ) (i) | කුරුවිට ප්‍රාදේශීය ලේකම් නිල නිවසේ පැවති පැරණි වහලය ලී රාමුව යොදා අලුතින් සකස් කිරීම | මෙම ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් | මේ වන විට නිලධාරිනියට විරුද්ධව විනය කටයුතු කරමින් පවතින බව |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙනුවෙන් රු.214,346ක් ගෙවා තිබුණ ද, ඒ සඳහා පැරණි වහලයේ තිබුණු යට ලී හා පරාල යොදා ගෙන තිබුණි. | සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතු ය. | |
| 2015 | 3.12 (ඇ) (iv) | 2010 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ නමුත් 2015 දෙසැම්බර් වන විටත් ඒවායේ වැඩ කටයුතු නිම කර අරමුණුගත කාර්යයෙහි යෙදවීමට අපොහොසත් වීම නිසා සංස්කෘතික මධ්‍යස්ථාන 05ක් ඉදිකිරීම වෙනුවෙන් එම කාලපරිච්ඡේදය තුළ වැය කළ රු. 12,952,497ක් නිෂ්ඵල වී තිබුණි. | ඉතිරි වැඩ කඩිනමින් අවසන් කර අදාල මධ්‍යස්ථානය උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. | මධ්‍යස්ථාන 02ක් මේ වන විට අවසන් අදියරට පැමිණ ඇති බවත්, මධ්‍යස්ථාන 02ක ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත්, එක් මධ්‍යස්ථානයක වැඩ අවසන් කර නොමැති බවත් ආදී වශයෙන් පිළිතුරු සපයා තිබීම. |

## 4. තිරසාර සංවර්ධනය

------------------------

### 4.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීමක් හෝ මඟපෙන්වීමක් සිදුකර නොතිබීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක 2019 වර්ෂය සඳහා පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඇතුළත් වී නොතිබුණි. | අදාළ අරමුණු හා ඉලක්ක පිළිබඳව ඵලදායීව දැනුවත් කිරීම සඳහා චක්‍රලේඛ හා මගපෙන්වීම් යොදා ගත යුතු බවත් ආයතනයට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමටද කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම පිළිබඳව කිසිදු උපදේශයක් අමාත්‍යාංශ මට්ටමින් හෝ තිරසර සංවර්ධන සභාව මගින් ලබා දී නැති බවත්, එසේ වුවද මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් හඳුනාගෙන එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් හා අදාළ නිලධාරීන් දැනුවත් කළ බවත් ය. |

## 5. යහපාලනය

---------------

## 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රාජ්‍ය ආයතන මගින් සේවාවන් ලබන මහජනතාවගේ අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටුකරන බවට ලිඛිත බැඳීමක් සඳහා සෑම රාජ්‍ය ආයතනයකම පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීමේ අරමුණින් 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් මෙම වැඩසටහන හඳුන්වා දී තිබුණි. මෙම අරමුණ ඉටුකරගැනීමට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06ක් සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ. | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | කඩිනමින් මේ සඳහා අවශ්‍ය කටයුතු නිම කිරීමට කටයුතු කරන බව. |
| • ඉහත චක්‍රලේඛයෙහි සඳහන් මාර්ගෝපදේශවලට අනුව පුරවැසි ප්‍රඥප්තිය ආරම්භ කොට ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යයනයන්, විශ්ලේෂණයන් මෙන්ම සැලසුම් කිරීම ද නිරන්තරයෙන් නොකඩවා කළ යුතු වුවද, වර්ෂ 5-10 කට පෙර පිළියෙල කරන ලද කෙටුම්පත හැර වෙනත් කිසිදු මාර්ගෝපදේශයක් ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| • මෙම චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව අදාළ ආයතනය විසින් සැලසුම් කර ඇති පරිදි පුරවැසි ප්‍රඥප්ති පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීමත්, එකී සේවාවන් වඩාත් ඵලදායීව සහ ගුණාත්මකව සැපයීම තහවුරු වී ඇත් ද යන්න පරීක්ෂාකාරී වීම පිණිස අධීක්ෂණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතු වුවද, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් වී නොමැති බව අනාවරණය විය. | -එම- | -එම- |
| • 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (I)දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදය අනුව ආයතන ප්‍රධානීන් තම පෞද්ගලික අවධානය යොමු කර පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට අදාළ උපදෙස් ආයතනය තුළ වඩාත් අර්ථවත් ලෙස ක්‍රියාත්මක කරන ලෙස දන්වා තිබුණ ද, ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | -එම- | -එම- |